# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2481/19 - 2026 මාර්තු මස 27 වැනි සිකුරාදා - 2026.03.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත**

නියමය

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති අනුර කුමාර දිසානායක වන මම, මෙහි පළමුවන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියලුම සාමාජිකයන්, මෙහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා 2026 මාර්තු මස 27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මේ නියමය මගින් කැඳවමි.

**අනුර කුමාර දිසානායක,**
ජනාධිපති.

2026 මාර්තු මස 27 වැනි දින.

**පළමුවන උපලේඛනය**

ශ්‍රී ලංකා යුද හමුදාව
ශ්‍රී ලංකා නාවික හමුදාව
ශ්‍රී ලංකා ගුවන් හමුදාව

1A - G 46515 — 354 (2026/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**දෙවැනි උපලේඛනය**

කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
කළුතර පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
මහනුවර පරිපාලන දිස්ත්‍රික්කය
මාතලේ පරිපාලන දිස්ත්‍රික්කය
නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කය
ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
මාතර පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
යාපනය පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
කිලිනොච්චිය පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
මන්නාරම පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
වවුනියාව පරිපාලන දිස්ත්‍රික්කය
මුලතිව් පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කය
පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කය
පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කය
බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කය
මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කය
රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය
කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කය

EOG 03 - 0215

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.